දෙපාර්තමේන්තු චක්‍රලේඛ 2010/23

මගේ අංකය - බ/12/01/001/වා.භා.ස./10

බන්ධනාගාර මූලස්ථානය,

2011/12/07

සියළුම කොමසාරිස්වරුන්,

සියළුම මාණ්ඩලික නිළධාරීන්,

සියළුම බන්ධනාගාර අධිකාරීන්,

සහකාර බන්ධනාගාර අධිකාරීන්,

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය - 2011වර්ෂය.**

**2012 ජනවාරි 15 දිනට පෙර භෞතික පරීක්ෂණය සහ 2012 ජනවාරි 30 දිනට පෙර සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම.**

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PF/FS/භා.ස./01 හා 2008/11/19 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේක 436 පරිදි වාර්ෂික ගබඩා සමීක්ෂණය පහත පරිදි නිම කළ යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

1. 2012 ජනවාරි 10 දිනට පෙර භෞතික භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කිරීම.
2. 2012 ජනවාරි 30 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ලබා ගැනීම.
3. 2012 පෙබරවාරි 17 දිනට පෙර ඌණතා / අතිරික්ත සසදා වාර්තා කිරීම.
4. 2011 පෙබරවාරි 28 දිනට පෙර විනාශ කළ යුතු භාණ්ඩ විනාශ කිරීම , අළුත්වැඩියා කළ යුතු භාණ්ඩ අළුත්වැඩියාව හා වෙන්දේසි කළ යුතු භාණ්ඩ වෙන්දේසි කර අවසන් කිරීම.
5. 2011 මාර්තු මස 16 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති හා 2006/07/30 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛ 422 අනුව රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් හා අනෙකුත් අදාළ ආයතන වෙත වාර්තා කිරීම.

මෙයට අමතරව භාණ්ඩ සමීක්ෂණ කටයුතු සම්බන්ධයෙන් පහත සඳහන් කර ඇති ලිපි හා චක්‍ර ලේඛ පිළිබඳවද දැඩි අවධානය යොමු කරන මෙන් කාරුණිකව දන්වමි.

| | | |
|---|---|---|
| ✦ දෙපාර්තමේන්තු චක්‍රලේඛ | - 2008/54 | - 2008/12/04 |
| ✦ දෙපාර්තමේන්තු චක්‍රලේඛ | - 2008/57 | - 2008/12/24 |
| ✦ දෙපාර්තමේන්තු චක්‍රලේඛ | - 2008/58 | - 2008/12/24 |
| ✦ දෙපාර්තමේන්තු චක්‍රලේඛ | - 2008/59 | - 2008/12/24 |
| ✦ ලිපි | - බ/12/08/වා.භා.ස./08 | - 2008/12/24 |

ඈ.පි.බ →

තවද,

- 2011 වසර අවසන් වනතුරු නොසිට අදාළ ආකෘති පත්‍ර ලබාගෙන දෙසැම්බර් මාසයේදි නිමකළ හැකි සියළුම කටයුතු නිම කිරිමට අදාළ උපදෙස් ලබා දෙන්න. සාමාන්‍ය වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයට අමතරව කාර්මික හා කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුමට අදාළව භාණ්ඩ සමීක්ෂණයේදි ද භාණ්ඩාගාර 66 ආකෘතිය සම්පූර්ණ කර තිබිය යුතු වේ. තවද, සුබසාධන ගිණුමට අදාළව ආකෘති ද වෙනම සකස් කළ යුතු වේ.
- පිටපත් 05කින් සකස් කරන ලද භාණ්ඩාගාර 66 ආකෘතිපත් වලින් එක් පිටපතක් බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙත 2012 ජනවාරි 05 වැනි දිනට පෙර යොමු කළ යුතු වේ.
- මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කළයුතු ආකාරය දැක්වෙන අමතර ලිඛිත උපදෙස් බන්ධනාගාර කොමසාරිස් (මුදල්) විසින් අවශ්‍ය අවස්ථාවන්හිදී අදාළ නිළධාරින්ට ලබා දීමට කටයුතු කළ යුතු වේ.
- 2011/12/31 දිනට භාණ්ඩ සමීක්ෂණ කටයුතු කිරිමේ දී දක්වන හැකියාව සම්බන්ධයෙන් ඇගයීම සඳහා ලකුණු ලබා දීමටද තීරණය කර ඇත. ඒ අනුව මු.රෙ.66 සකස්කිරිම සම්බන්ධයෙන් හොඳම බන්ධනාගාරයට සහ නිළධාරින්ට ලකුණු ලබා දීමට නියමිතය. මු.රෙ.66 , ජනවාරි 05 දිනට ඉදිරිපත් කරන අයට ලකුණු 100 ක් ලබාදෙන අතර ප්‍රමාදවන එක් දිනක් සඳහා ලකුණු 10 බැගින් අඩු කරනු ලැබේ. දින 10කට වඩා ප්‍රමාද වුවහොත් කිසිම ලකුණක් නොලැබේ. ප්‍රමාදවීම් සඳහා යම් ලකුණු ප්‍රමාණයක් අඩු කිරිමටද නියමිතය.

පී.ඩබ්ලිව්.කොඩිප්පිලි

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

**පී.ඩබ්ලිව්. කොඩිප්පිලි**
**බන්ධනාගාර කොමසාරිස් ජනරාල්**
**බන්ධනාගාර මූලස්ථානය**
**කොළඹ 09.**

පිටපත් - 01 විගණකාධිපති
02 රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්